**<u>තාක්ෂණ අංශය</u>**

මහජන සේවා තොරතුරු පොදු මහජනතාවට ලබා දෙන ලද සේවාවන් ඊට අදාලව නිකුත් කර ඇති උපදෙස් පොත් පත්‍රිකා ආකෘති පත්‍ර ගාස්තු හා ඒවාට අදාල කාල පරාසයන්.

තාක්ෂණ අංශය
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ අධීක්ෂණ හා ඇගයීම්
සන්නිවේදන උපදේශක
ඉංජිනේරු සම්බන්ධීකාරක
ප්‍රධාන ලිපිකරු(හමුදා)
ප්‍රධාන ලිපිකරු(සිවිල්)

මෙහි පහත සඳහන් සියළු කාර්යන් සඳහා ආරක්ෂක නිශ්කාෂණ වාර්තා රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලබා ගන්නා අතර ඒ අනුව නිසි අවසරය විදුලි සංදේශණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා රේගුව, ආනයන හා අපනයන පාලන,ධීවර හා ජලජ සම්පත් දෙපාර්ථමේන්තුව වෙත උපරිම කාල සීමාව සති දෙකකට යටත්ව ලබා දෙනු ලැබේ.සන්නිවේදන උපකරණ ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශණ නියාමන කොමිෂන් සභාව විසිනි . මෙම අවසරය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය කිසිදු මුදලක් අයකරනු නොලැබේ.

1. රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීමට අවසර දීම (HF,VHF,UHF)
2. විදුලි සංදේශ උපකරණ විකිණීම සඳහා පුද්ගලයන් වෙත වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ආරක්ෂක නිශ්කාෂණ ලබා දීම.
3. සන්නිවේදන ආයතන සඳහා අවසර ලබා දීම සහ දිවයින ඇතුලත සංඥ කුලුණු ඉදිකිරීමට අවසර ලබා දීම.
4. තෝරාගත් තනතුරු ලාබී පුද්ගලයන්ට අංක හඳුනා නොගැනීමේ දුරකථන පහසුකම් සඳහා අවසර දීම.(CLIR)
5. ධීවර කර්මාන්තයෙහි නියුතු වූවන්ට ධීවර යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබා දීම.
6. වෙළඳ නැව් ශ්‍රී ලංකා රජය යටතේ යාත්‍රා කිරීම සඳහා අවසර දීම.
7. රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන අළුතින් විකාශනය කිරීමට අවසර දීම සහ ඒ සඳහා අවශ්‍ය සන්නිවේදන උපකරණ ආනයනය කිරීමට සහ සන්නිවේදන කුලුණු වළ ස්ථාපනය කිරිම සඳහා අවසර ලබා දිම.
8. වර්ණ මුද්‍රණ යන්ත්‍ර (color photo & printer) ආනයනය කිරීම සඳහා අවසර දීම.
9. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ක්‍රිකට් තරඟ විකාශය කිරීමට අවසර ලබා දීම.
10. දැනට අවසර දී ඇති 400cc ධාරිථාරිතාවයට වඩා වැඩි ධාරිථාවයෙන් යුතු මෝටර් සයිකල් ආනයනය කිරීමට සහ ක්‍රීඩා තරඟ සඳහා භාවිතා කිරීමට අවසර ලබා දීම.
11. කුඩා ගුවන් යානා (Drone) ශ්‍රී ලංකාවට ආනයනය කිරිම සඳහා අවසර ලබා දිම.